# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2302/23 - 2022 ඔක්තෝබර් මස 20 වැනි බ්‍රහස්පතින්දා - 2022.10.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 4/2003

**2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනත**

2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ 7 වන වගන්තියේ (3) වන උපවගන්තිය, 8 වන, 10 වන, 11 වන සහ 12 වන වගන්ති සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වන ව්‍යවස්ථාව සමග කියවිය යුතු එම පනතේ 27 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග.

**රනිල් වික්‍රමසිංහ,**
ජනාධිපති.

2022 ඔක්තෝබර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2022 අංක 1 දරන සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ (ගෙවීම් ලැබීම් පිණිස සුදුසු තැනැත්තන් තෝරා ගැනීම) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

**I කොටස**

*සාමාන්‍ය*

2. (1) මෙහි I වන උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති තේරීම් උපමාන යටතේ සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් සඳහා ඉල්ලුම් කිරීමට, කොමසාරිස්වරයා විසින් යම් තැනැත්තකු වෙත ඉල්ලීමක් කරමින් යටත් පිරිසෙයින් සිංහල හා දෙමළ භාෂාවන්ගෙන් පළ කරනු ලබන දිනපතා පුවත්පත් දෙකක දැන්වීම් පළ කරනු ලැබිය යුතු ය.

1A - PG 6014— 706 (2022/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) I වන අනු නියෝගයේ සඳහන් දැන්වීමෙහි -

(*අ*) සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබන තැනැත්තන්;
(*ආ*) සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් සඳහා වන ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන ආකාරය;
(*ඇ*) ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීම සඳහා වන කාලසීමාව.

පිළිබඳ නිශ්චිතව දැක්විය යුතු ය.

(3) පනතේ 7 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව සෑම ඉල්ලුම් පත්‍රයක් සමගම ප්‍රකාශනයක් ඉදිරිපත් කළ යුතු ය.

(4) (මෙහි මින් මතු "ඉල්ලුම්කරු" යනුවෙන් සඳහන් කරනු ලබන) සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් සඳහා ඉල්ලුම් කරනු ලබන තැනැත්තා පදිංචි වී සිටින ප්‍රාදේශයේ අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා වෙත,

(*අ*) ඉල්ලුම්කරු විසින් අත්සන් කරනු ලබන; සහ
(*ආ*) මෙහි II වන උපලේඛනයෙහි දක්වා ඇති ආකෘතියෙන් වන,

(3) වන අනුනියෝගයේ සඳහන් සෑම ප්‍රකාශනයක් ම ඉදිරිපත් කළ යුතු ය.

එසේ වුව ද, යම් අශක්නුතාවක් හේතුවෙන් ඉල්ලුම්කරු විසින් ප්‍රකාශනයක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී, එම ඉල්ලුම්කරුගේ පවුලේ සාමාජිකයකු විසින් හෝ ඉල්ලුම්කරු වෙනුවට වෙනත් තැනැත්තකු විසින් ප්‍රකාශනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(5) පනත යටතේ යම් තැනැත්තකු සුබසාධක ප්‍රතිලාභ ගෙවීමක් සඳහා සුදුසුකම් ලබන්නේ ද යන වග නිශ්චය කර ගැනීමේ කාර්යය සඳහා පත් කරනු ලබන තේරීම් කමිටුව විසින් (3) වන අනුනියෝගයේ සඳහන් ප්‍රකාශනය පිළිබඳ සලකා බැලිය යුතු ය.

3. මේ නියෝගවල කාර්ය සඳහා එක් එක් ප්‍රාදේශීය ලේකම්වරයා විසින්, 2 වන නියෝගයේ (3) වන අනුනියෝගයේ සඳහන් ප්‍රකාශනයෙහි සපයන ලද තොරතුරු, පනතේ කාර්යය සඳහා 2006 අංක 19 වන ඉලොක්ට්‍රොනික ගනුදෙනු පනත යටතේ සාදනු ලබන නියෝග ප්‍රකාරව ඉලෙක්ට්‍රොනික ලේඛන සහ ඉලෙක්ට්‍රොනික වාර්තා ස්වරූපයෙන් රඳවා තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

## II කොටස

### *සුබසාධක ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු පද්ධතිය පිහිටුවීම*

4. (1) මණ්ඩලය විසින්, මණ්ඩලයේ කොමසාරිස්වරයා යටතේ පැවතිය යුතු සුබසාධන ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු පද්ධතියක් ඉලෙක්ට්‍රොනිකව සහ අන්‍යාකාරයෙන් පිහිටුවා පවත්වාගෙන යා යුතු ය.

(2) එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට අදාළ සුබසාධක ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු පවත්වාගෙන යාමේ කාර්යය සඳහා මණ්ඩලය විසින්, එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පිහිටා තිබිය යුතු සුබසාධක ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු ඒකකය යනුවෙන් හඳුන්වනු ලබන ඒකකයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(3) සෑම සුබසාධක ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු ඒකකයක් විසින් ම, ඒ වෙනුවෙන් 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත යටතේ සාදනු ලබන නියෝග ප්‍රකාරව ඉලෙක්ට්‍රොනික ලේඛන සහ ඉලෙක්ට්‍රොනික වාර්තා ආකාරයෙන් සුබසාධක ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු පවත්වාගෙන යා යුතු ය.

(4) සෑම සුබසාධක ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු ඒකකයක් ම, මණ්ඩලයේ කොමසාරිස්වරයා යටතේ පවතින (1) වන අනුනියෝගයෙහි සඳහන් සුබසාධක ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු පද්ධතියට සම්බන්ධ කරනු ලැබිය යුතු ය.

(5) සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක ම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට සුබසාධක ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු ඒකකය පවත්වාගෙන යාම සඳහා මණ්ඩලය විසින්, පනතේ 6 වන වගන්තිය යටතේ බලයලත් නිලධරයන් පත් කරනු ලැබිය යුතු ය.

(6) (1) වන අනුනියෝගයෙහි සඳහන් තොරතුරු පද්ධති වසර දහයක කාලසීමාවක් සඳහා සංරක්ෂණය කරනු ලැබිය යුතු ය.

## III කොටස

### *තේරීම් කමිටු පත් කිරීම සහ ඒවායෙහි බලතල හා කර්තව්‍ය*

5. (1) මණ්ඩලය විසින්, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් සඳහා අවශ්‍ය විය හැකි පරිදි තේරීම් කමිටු සංඛ්‍යාවක් පත් කරනු ලැබිය යුතු ය.

(2) තේරීම් කමිටුවක් විසින්, 2 වන නියෝගයේ (3) වන අනුනියෝගයෙහි සඳහන් ප්‍රකාශනයේ නිරවද්‍යතාව පරීක්ෂා කිරීම සහ නිශ්චය කිරීම කළ යුතු ය.

(3) සෑම තේරීම් කමිටුවක් ම -

(අ) තේරීම් කමිටුවේ සභාපතිවරයා විය යුතු අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත සහකාර ප්‍රාදේශීය ලේකම්වරයා හෝ සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) හෝ ගණකාධිකාරවරයා ;

(ආ) අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත සමාජ සේවා නිලධරයකු, සමෘද්ධි කළමනාකරුවකු, පරිපාලන ග්‍රාම නිලධාරිවරයකු හෝ පරිපාලන නිලධරයකු; සහ

(ඇ) (මෙහි මින් මතු "සංගණන නිලධරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මේ නියෝගවල කාර්ය සඳහා ඉල්ලුම්කරුවන්ගේ දත්ත එකතු කිරීමේ, රඳවා තබාගැනීමේ සහ ආවයනය කිරීමේ කාර්යය ඉටු කරනු ලබන රජයේ නිලධරයකු,

යන තැනැත්තන් අතරින් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු ය.

(4) තේරීම් කමිටුවේ සාමාජිකයන් විසින්, මිය යාමෙන්, ඉවත් කිරීමෙන් හෝ අන්‍යාකාරයෙන් ස්වකීය ධුරය කලින් හිස් කළහොත් මිස, ඔහු පත් කළ දින සිට වසරක කාලසීමාවක් සඳහා ධුරය දැරිය යුතු අතර, එකී සාමාජිකයන් නැවත පත් කිරීම සඳහා සුදුසු වන්නේ ය.

(5) යම් සාමාජිකයකු ඉල්ලා අස්වීම හෝ මාරුවීම හේතුවෙන් නිශ්චිත කාලසීමා සඳහා ස්වකීය ධුරය දැරීමට අපොහොසත් වන අවස්ථාවක, ඔහු වෙනුවට වෙනත් සාමාජිකයකු, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුරකාලයෙන් ඉකුත් නොවී ඇති ධුර කාලය සඳහා ධුරය දැරීම සඳහා පත් කරනු ලැබිය යුතු ය.

(6) මණ්ඩලය විසින්, මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැති ඇතිව තේරීම් කමිටුවේ සාමාජිකයන්ට දීමනා ගෙවනු ලැබිය යුතු ය.

(7) අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින්, හේතු දක්වා මණ්ඩලයේ උපදෙස් යටතේ තේරීම් කමිටුවේ යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(8) පනතේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි පරිදි ප්‍රකාශනයේ සපයා ඇති තොරතුරුවල නිරවද්‍යතාව පරීක්ෂා කිරීම සහ නිශ්චය කිරීම සඳහා සංගණන නිලධරයා විසින් ඉල්ලුම්කරු පදිංචි ස්ථානය වෙත යා යුතු වන්නේ ය.

(9) තේරීම් කමිටුවේ සාමාජිකයන් විසින්, පනතේ 10 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, ඉල්ලුම්කරුවන්ගේ ප්‍රකාශනවල සපයා ඇති තොරතුරුවල නිරවද්‍යතාව පරීක්ෂා කිරීම සහ නිශ්චය කිරීම කරනු ලැබිය යුතු අතර, සුබසාධන ප්‍රතිලාභ ගෙවීම් ලැබීම පිණිස ඔවුන්ගේ මතය අනුව සුදුසුකම් ලබන ඉල්ලුම්කරුවන්ගේ නම් ඇතුළත් ලැයිස්තුවක් අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයාගේ පිටසන සමඟ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(10) (9) වන උපනියෝගයෙහි සඳහන් නම් ලැයිස්තුව තමා වෙත ලැබීමෙන් පසු, කොමසාරිස්වරයා විසින්, සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් පිණිස සුදුසුකම් ලබන ඉල්ලුම්කරුවන් තෝරාගැනීම සඳහා එම නම් ලැයිස්තුව මණ්ඩලය වෙත යොමු කරනු ලැබිය යුතු අතර, පනතේ 11 වන වගන්තිය ප්‍රකාරව තෝරාගනු ලැබූ ඉල්ලුම්කරුවන්ගේ ලැයිස්තුවක් ඇතුළත් දැන්වීමක් පළකරනු ලැබිය යුතු ය.

## IV කොටස

*අභියාචන කමිටුව*

6. (1) මණ්ඩලය විසින්, සෑම පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා ම අභියාචන කමිටු යම් සංඛ්‍යාවක් පත් කරනු ලැබිය යුතු ය.

(2) අදාළ පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරයාගේ උපදෙස් මත එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය සඳහා අවශ්‍ය අභියාචනා කමිටු සංඛ්‍යාව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(3) එක් එක් අභියාචන කමිටුව පහත දැක්වෙන පරිදි සාමාජිකයන් පස්දෙනෙකුගෙන් සමන්විත විය යුතු ය :-

(අ) අභියාචනා කමිටුව පත්කරනු ලබන්නේ යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් හෝ කොට්ඨාස සම්බන්ධයෙන් ද එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හෝ කොට්ඨාස හැර වෙනත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් වෙත අනුයුක්ත කර ඇති ප්‍රාදේශීය ලේකම්වරයකු ;

(ආ) අදාළ පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත කර ඇති රජයේ නිලධරයන් දෙදෙනෙකු; සහ

(ඇ) අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සුබසාධක ප්‍රතිලාභ කටයුතුවල සක්‍රීයව නිරත වන රාජ්‍ය නොවන සංවිධාන නියෝජනය කරනු ලබන තැනැත්තන් දෙදෙනකු.

(4) මණ්ඩලය විසින්, දිස්ත්‍රික් ලේකම්වරයාගේ උපදෙස් මත අභියාචන කමිටුවක යම් සාමාජිකයකු ඕනෑම අවස්ථාවක ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(5) මණ්ඩලය විසින්, මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි යම් ආකාරයකට සහ යම් අනුප්‍රමාණ මත අභියාචන කමිටුවේ සභාපතිවරයාට සහ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

(6) පත් කළ සාමාජිකයකු, ඉල්ලා අස්වීම හෝ මාරුවීම හේතුවෙන් නිශ්චිත කාලසීමා සඳහා ස්වකීය ධුරය දැරීමට අපොහොසත් වන අවස්ථාවක, ඔහු වෙනුවට වෙනත් සාමාජිකයකු, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නෙගෙවී ඉතිරිවී ඇති කාලසීමාව සඳහා ධුරය දැරීමට පත්කරනු ලැබිය යුතු ය.

## V කොටස

### *අභියාචන කාර්යපටිපාටිය*

7. (1) තේරීම් කමිටුවේ තීරණය මගින් අගතියට පත් යම් තැනැත්තකු විසින්, පනතේ 11 වන වගන්තිය යටතේ දැන්වීම පළ කරනු ලැබූ දින සිට දින දහයක් ඇතුළත, එම වගන්තිය ප්‍රකාරව විරෝධතා හෝ හිමිකම්පෑම්, මෙහි III වන උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති ආකෘතියට සාරානුකූලව කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) කොමසාරිස්වරයා විසින්, එම විරෝධතා හෝ හිමිකම්පෑම් පිළිබඳ පරීක්ෂණයක් හෝ විමර්ශනයක් කිරීම සඳහා ඒවා ලද දින සිට සති දහයක් ඇතුළත 6 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ අභියාචනා කමිටුව වෙත එම විරෝධතා හෝ හිමිකම්පෑම් ඉදිරිපත් කළ යුතු ය.

(3) සෑම අභියාචන කමිටුවක් විසින් ම, එකී පරීක්ෂණ සහ විමර්ශන පවත්වනු ලැබිය යුතු අතර, අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහාය ඇතිව, (2) වන උපනියෝගය යටතේ අභියාචන කමිටුව විසින් ලද තොරතුරු සත්‍යායනය කිරීම සහ පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව කොමසාරිස්වරයා වෙත එහි තීරණය දැනුම්දීම කළ යුතු ය.

(4) අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින්, 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත යටතේ සාදනු ලැබූ නියෝග ප්‍රකාරව ඉලෙක්ට්‍රොනික වාර්තා සහ ඉලෙක්ට්‍රොනික ලේඛන ඇතුළු යම් අභියාචන කමිටුවක් විසින් පවත්වනු ලැබූ පරීක්ෂණ සහ විමර්ශන වාර්තා සහ ඒ පිළිබඳ තීරණ, අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පිහිටා ඇති සුබසාධක ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු ඒකකයෙහි පවත්වාගෙන යාමට කටයුතු සැලැස්විය යුතු ය.

(5) 3 වන අනුනියෝගයේ සඳහන් කර ඇති දැනුම්දීමක් ලැබීමෙන් සති දෙකක් ඇතුළත කොමසාරිස්වරයා විසින්, ඒ සම්බන්ධයෙන් වන විරෝධතාව හෝ හිමිකම් පෑම ඉදිරිපත් කළ තැනැත්තා වෙත මණ්ඩලයේ තීරණය දැනුම්දිය යුතු ය.

8. මේ නියෝගවල -

"පනත" යන්නෙන්, 2022 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනත අදහස් වේ;

"මණ්ඩලය" යන්නෙන්, 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ 3 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය අදහස් වේ;

"කොමසාරිස්වරයා" යනනෙන්, 2022 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ 2 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ සුබසාධක ප්‍රතිලාභ කොමසාරිස්වරයා අදහස් වේ;

"දිස්ත්‍රික් ලේකම්" යන්නෙන්, පරිපාලන දිස්ත්‍රික්කයක් සම්බන්ධයෙන් වන විට, ආණ්ඩුව විසින් ඒ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා පත් කරන ලද දිස්ත්‍රික් ලේකම්වරයා අදහස් වේ;

"ප්‍රාදේශීය ලේකම් කාර්යාලය", "ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය" සහ "ප්‍රාදේශීය ලේකම්වරයා" යන්නට, 1992 අංක 58 දරන බලතල පැවරීමේ (ප්‍රාදේශීය ලේකම්වරයා) පනතේ දී ඇති අර්ථය ම ඇත්තේ යඃ

"ඉලෙක්ට්‍රොනික" යන්නට, 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත යටතේ එම යෙදුමට දී ඇති අර්ථයම ඇති අතර, "ඉලෙක්ට්‍රොනිකව" යන යෙදුම ඒ අනුව තේරුම් ගත යුතු ය;

"රාජ්‍ය නොවන සංවිධානය" යන්නෙන්, 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ යම් සංවිධානයක් අදහස් වේ.

[2 (1) නියෝගය]

## පළමුවන උපලේඛනය

### තේරීම් උපමාන

### සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීම පිණිස සුදුසු තැනැත්තන්/ පවුල් තෝරා ගැනීම

*පොදු මානයන් හා දර්ශක*

සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීම පිණිස සුදුසු තැනැත්තන්/ පවුල් තෝරා ගැනීමේ ක්‍රමවේදය සඳහා මානයන් හයක් යොදා ගනු ලබන අතර එම එක් එක් මානය ඊට විශේෂිත දර්ශක යොදා ගෙන මනිනු ලැබේ. සෑම අයදුම්කරුවෙකුටම 100%ක උපරිම ලකුණු ලැබිය හැකි අතර, ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලද ගෘහස්ත ආදායම් හා වියදම් පිළිබඳ සමීක්ෂණය පදනම් කරගත් විශේෂිත බර තැබූ දර්ශකයකට අනුව එක් එක් දර්ශකයට අදාළව දිළිඳු/දුප්පත් පවුල් සංඛ්‍යාව ගණනය කිරීම කරනු ඇත. අදාළ මානයන් සහ දර්ශක 1 වන කොටසේ දක්වා ඇත. දර්ශකවල ලකුණු සීමාව ගණනය කිරීමේ ක්‍රමය II කොටසේ දක්වා ඇති අතර දරිද්‍රතා ලකුණු ලබාදීම ගණනය කිරීමේ සූත්‍රය III කොටසේ දක්වා ඇත.

### I කොටස

### පොදු මානයන් සහ දර්ශක

| *මානයන්* | *දර්ශක* |
|---|---|
| 1. **අධ්‍යාපනය** | i. පවුලේ සාමාජිකයින්ගේ අධ්‍යාපන මට්ටම,<br>ii. වයස අවුරුදු 5 - 16 අතර පාසල් නොයන ළමුන් සංඛ්‍යාව. |
| 2. **සෞඛ්‍ය** | i. දිගුකාලීන නිදන්ගත රෝගවලින් පෙළෙන පවුලේ සාමාජිකයින්,<br>ii. ආබාධ සහිත පවුලේ සාමාජිකයින්. |
| 3. **ආර්ථික මට්ටම** | i. මාසික ඒක පුද්ගල වියදම.<br>ii. මාසික ඒක පුද්ගල ආදායම.<br>iii. මසකට ඒකක 60ට වඩා අඩු විදුලි පරිභෝජනය. |
| 4. **වත්කම්** | i. වාසය කරන නිවාස හා ඉඩම පවුලේ සාමාජිකයෙකුට හිමි වී නොතිබීම.<br>ii. පවුලේ සාමාජිකයෙකුට වෙනත් නිවසක හෝ ගොඩනැගිල්ලක අයිතියක් නොතිබීම.<br>iii. පවුලට අවම වශයෙන් අක්කර 0.5ක වගාකළ හැකි ගොඩ ඉඩමක් නොතිබීම.<br>iv. පවුලට අවම වශයෙන් අක්කර එකක වගා කළ හැකි කුඹුරු ඉඩමක් නොතිබීම.<br>v. ගමනාගමනයට අදාළ එක් වත්කමක්වත් නොතිබීම, (මෝටර් සයිකල් CC ≥125, ත්‍රී රෝද රථයක්, මෝටර්රථයක්, වෑන් රථයක්, ජීප් රථයක්, බසයක්, ලොරි රථයක්, ටිපර් රථයක්, අත් ට්‍රැක්ටරයක් (රෝද 2), ට්‍රැක්ටරයක් (රෝද 4)<br>vi. අවම වශයෙන් ආර්ථික ක්‍රියාකාරකමකට අදාළ එක වත්කමක්වත් නොතිබීම. (ධීවර බෝට්ටු, ඒකාබද්ධ අස්වැන්න නෙලීමේ යන්ත්‍ර, කොළ මඩින යන්ත්‍ර)<br>vii. අවම වශයෙන් ජීවනෝපායට අදාළ එක් වත්කමක්වත් නොතිබීමයි. (කිරි ගවයින් 05, එළුවන් 20, කුකුළන් 50, තාරාවන් 50, ඌරන් 10) |
| 5. **නිවාස තත්වය** | i. ලැයිම් කාමර/ පේළි නිවාස/ මුඩුක්කු/ මඩු වල ජීවත්වීම හෝ වෙනත්.<br>ii. ජීවත්වීමට ස්ථිර බිත්ති, ස්ථිර ගෙබිම හා ස්ථිර වහල සහිත නිවාසයක් නොමැති වීම.<br>iii. සම්පූර්ණ බිම් ප්‍රදේශය වර්ග අඩ 500ට අඩු වීම.<br>iv. පානීය ජලය ලබා ගැනීමේ හැකියාවක් නොමැති වීම.<br>v. අවශ්‍ය සනීපාරක්ෂක පහසුකම් නොමැති වීම.<br>vi. විදුලි බලය නොමැති වීම. |

| *මානයන්* | *දර්ශක* |
|---|---|
| **6. පවුලේ ජන විකාශනය** | i. යැපීම් අනුපාතය (අවුරුදු 0 - 14 අතර සිටින සංඛ්‍යාව හා අවුරුදු 65 හා ඊට වැඩි වයස ඇති අය/ අවුරුදු 15- 64 අතර සිටින පුද්ගලයින් සංඛ්‍යාව) 0.64 වඩා වැඩිවීම.<br>ii. මව හෝ පියා පමණක් සිටින පවුලක් වීම. |

## II කොටස

### ගණනය කිරීමේ ක්‍රමය

**දර්ශක හා දර්ශකවල සීමාව**

1. **අධ්‍යාපනය**

i. පවුලේ සාමාජිකයින්ගේ ඉහළම අධ්‍යාපන මට්ටම.
අ.පො.ස. සාමාන්‍ය පෙළ හෝ ඊට ඉහළ මට්ටම සමත් වීම →දිළිඳු / දුප්පත් නොවේ (0)
අ.පො.ස. සාමාන්‍ය පෙළට වඩා අඩු →දිළිඳු / දුප්පත් (1)

ඉහළම අධ්‍යාපන මට්ටම ලෙස අ.පො.ස. සාමාන්‍ය පෙළ හෝ ඊට ඉහළ මට්ටම සමත්ව තිබීම "දිළිඳු/ දුප්පත් නොවන" ලෙස සලකන අතර ඉහළම අධ්‍යාපන මට්ටම ලෙස 10 වන ශ්‍රේණිය හෝ ඊට පහළ මට්ටම සමත් වීම. විශේෂ අධ්‍යාපන, පාසල් නොයාම "දිළිඳු / දුප්පත්" ලෙස සලකනු ලැබේ.

ii. පවුලේ සියළු සාමාජිකයින්ගෙන් පාසල් යන වයසේ (අවුරුදු 5 - 16) හා දැනට පාසල් යන සාමාජිකයින් (වයස අවුරුදු 5 - 16) පාසල් හෝ වෙනත් අධ්‍යාපන ආයතනයකට සහභාගි වන ................. →දිළිඳු / දුප්පත් නොවේ (0)
සාමාජිකයින් (වයස අවුරුදු 5 - 16) දැනට පාසල් හෝ වෙනත් අධ්‍යාපන ආයතනයකට නොයන ............................ →දිළිඳු / දුප්පත් (1)

පාසල් යන වයසේ පසු වන සියළු පවුලේ සාමාජිකයින් පාසල් හෝ වෙනත් අධ්‍යාපන ආයතනයකට සහභාගී වන්නේ නම්, (අවුරුදු 5 - 16) දිළිඳු / දුප්පත් නොවන ලෙස සලකනු ලබන අතර පාසල් යන වයසේ පසුවන (අවුරුදු 5 - 16) පවුලේ සාමාජිකයින් කවුරුන් හෝ පාසල් නොයන්නේ නම් දිළිඳු / දුප්පත් ලෙස සලකනු ලැබේ.

2. **සෞඛ්‍යය**

i. පවුලේ සාමාජිකයෙකු දිගුකාලීන (නිදන්ගත) රෝගයකින් පෙළෙන්නේ නැතිනම් →දිළිඳු / දුප්පත් නොවේ (0)
දිගුකාලීන (නිදන්ගත) රෝගයකින් පෙළෙන්නේ නම් ..................... →දිළිඳු / දුප්පත් (1)

පවුලේ සාමාජිකයෙකු හෘද රෝග, ආඝාතය, දියවැඩියාව, පිළිකා, අධි රුධිර පීඩනය, වකුගඩු රෝග, මානසික රෝග වැනි දිගුකාලීන (නිදන්ගත) රෝග හෝ වෙනත් දිගුකාලීන රෝගාබාධවලින් නොපෙළෙන්නේ නම් දිළිඳු / දුප්පත් නොවන ලෙස සලකනු ලබන අතර එක් සාමාජිකයෙකු හෝ එවන් රෝගාබාධයකින් පෙළෙන්නේ නම් දිළිඳු / දුප්පත් ලෙස සලකනු ලැබේ.

ii. ආබාධ සහිත පවුලේ සාමාජිකයෙකු,
ආබාධිත නොවන ..................... →දිළිඳු / දුප්පත් නොවේ (0)
ආබාධිත ..................... →දිළිඳු / දුප්පත් (1)

පවුලේ සාමාජිකයෙකු ආබාධිත නොවන්නේ නම් ඔවුන් දිළිඳු / දුප්පත් නොවන ලෙස සලකන ලබන අතර පවුලේ යම් සාමාජිකයෙකු ආබාධිත නම් ඔවුන් දිළිඳු / දුප්පත් ලෙස සලකනු ලැබේ.

3. **ආර්ථික මට්ටම**

i. ඒක පුද්ගල වියදම
මාසික ඒක පුද්ගල වියදම ≥ තීරණය කරනු ලබන වියදම *... →දිළිඳු / දුප්පත් නොවේ (0)
මාසික ඒක පුද්ගල වියදම < තීරණය කරනු ලබන වියදම *... →දිළිඳු / දුප්පත් (1)

මාසික ඒක පුද්ගල වියදම තීරණය කරනු ලබන වියදමට සමාන හෝ ඊට වැඩි වන්නේ නම් දිළිඳු / දුප්පත් ලෙස සලකනු නොලබන අතර මාසික ඒක පුද්ගල වියදම තීරණය කරනු ලබන වියදමට වඩා අඩු නම් දිළිඳු / දුප්පත් ලෙස දක්වනු ලැබේ.

ii. මාසික ඒක පුද්ගල ආදායම

මාසික ඒක පුද්ගල ආදායම ≥ තීරණය කරනු ලබන ආදායම *......... →දිළිඳු / දුප්පත් නොවේ (0)
මාසික ඒක පුද්ගල ආදායම < තීරණය කරනු ලබන ආදායම *......... →දිළිඳු / දුප්පත් (1)

මාසික ඒක පුද්ගල ආදායම තීරණය කරනු ලබන ආදායමට සමාන හෝ ඊට වඩා වැඩ නම් දිළිඳු / දුප්පත් ලෙස සලකනු නොලබන අතර මාසික ඒක පුද්ගල ආදායම තීරණය කරනු ලබන ආදායමට වඩා අඩු නම් දිළිඳු / දුප්පත් ලෙස සලකනු ලැබේ.

***සටහන** : මෙම වියදම් සහ ආදායම් සීමාවන් ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන නිල දරිද්‍රතා රේඛාව අනුව තීරණය වේ.

iii. විදුලි පරිභෝජනය

සාමාන්‍ය මාසික විදුලි පරිභෝජනය ≥ 60 kWh ................... →දිළිඳු / දුප්පත් නොවේ (0)
සාමාන්‍ය මාසික විදුලි පරිභෝජනය < 60 kWh ................... →දිළිඳු / දුප්පත් (1)

සාමාන්‍ය මාසික විද්‍යුත් පරිභෝජනය 60 kWh ට සමාන හෝ ඊට වැඩි නම් දිළිඳු / දුප්පත් ලෙස සලකනු නොලබන අතර සාමාන්‍ය මාසික විද්‍යුත් පරිභෝජනය 60 kWh ට අඩු නම් දිළිඳු / දුප්පත් ලෙස සලකනු ලැබේ.

4. **වත්කම්**

i. පවුලේ සාමාජිකයෙකු / සාමාජිකයින්ට නේවාසික නිවසක් සහිත ඉඩමක හිමිකාරිත්වය.

නිවාස හිමි ....................... →දිළිඳු / දුප්පත් නොවේ (0)
නිවාස හිමි නැති ....................... →දිළිඳු / දුප්පත් (1)

පවුලේ සාමාජිකයෙකු / සාමාජිකයින්ට නේවාසික නිවසක් සහිත ඉඩමක හිමිකාරිත්වය තිබේ නම් දිළිඳු / දුප්පත් ලෙස සලකනු නොලබන අතර එසේ නොවේනම් දිළිඳු / දුප්පත් ලෙස සලකනු ලැබේ.

ii. පවුලේ සාමාජිකයෙකු / සාමාජිකයින්ට වෙනත් නිවාස/ ගොඩනැගිලිවල හිමිකාරිත්වය

නිවාස/ ගොඩනැගිලි හිමි ....................... →දිළිඳු / දුප්පත් නොවේ (0)
නිවාස/ ගොඩනැගිලි හිමි නැති ....................... →දිළිඳු / දුප්පත් (1)

පවුලේ සාමාජිකයින්ට වෙනත් නිවාස/ ගොඩනැගිලි හිමිව තිබේ නම් දිළිඳු / දුප්පත් නොවන ලෙස සලකනු ලබන අතර ඔවුන්ට වෙනත් නිවසක් ගොඩනැගිල්ලක් නොමැති නම් දිළිඳු / දුප්පත් ලෙස සලකනු ලැබේ.

iii. පවුලේ සාමාජිකයෙකුට/ සාමාජිකයින්ට ගොඩ ඉඩම් අක්කර 0.5 හෝ ඊට වැඩි ප්‍රමාණයක් සඳහා ඇති අයිතිය

අක්කර 0.5 හෝ ඊට වැඩි ප්‍රමාණයක් අයිති වන්නේ නම් ....................... →දිළිඳු / දුප්පත් නොවේ (0)
අක්කර 0.5 අඩු ප්‍රමාණයක් අයිති වන්නේ නම් ....................... →දිළිඳු / දුප්පත් (1)

පවුල සතු සියළු ගොඩ ඉඩම් ප්‍රමාණය අක්කර 1/2 හෝ ඊට වඩා වැඩි වන්නේ නම් දිළිඳු / දුප්පත් නොවන ලෙස හඳුන්වනු ලැබේ. ඔවුන්ට කිසිම ගොඩ ඉඩමක් නොමැති නම් හෝ සියළු ගොඩ ඉඩම්වල එකතුව අක්කර 1/2ට අඩු නම් දිළිඳු/ දුප්පත් ලෙස සලකනු ලැබේ.

iv. පවුලේ සාමාජිකයෙකුට/ සාමාජිකයින්ට අයත් වන කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කර 01 කට සමාන හෝ ඊට වැඩි වන්නේ නම්,

අක්කර එකක් ≥ අයත් වන ....................... →දිළිඳු / දුප්පත් නොවේ (0)
අක්කර එකකට < අයත් වන ....................... →දිළිඳු / දුප්පත් (1)

පවුල සතුව ඇති සියළු කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කර 01 හෝ ඊට වඩා වැඩි වන්නේ නම් ඔවුන් දිළිඳු / දුප්පත් නොවේ. සියළු කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කර 01 ට අඩු වන්නේ නම් දිළිඳු / දුප්පත් ලෙස සලකනු ලැබේ.

v. අවම වශයෙන් ගමනාගමනයට අදාළ මෝටර් සයිකල් CC ≥ 125, ත්‍රී රෝද රථයක්, මෝටර් රථයක්, වෑන් රථයක්, ජීප් රියක්, බසයක්, ලොරි රථයක්, ටිපර් රථයක්, අත් ට්‍රැක්ටරයක් (රෝද 2) ට්‍රැක්ටරයක් (රෝද 4) වැනි එක් වත්කමක්වත් හිමිකාරිත්වය.

හිමිකාරිත්වය ඇති ...................... →දිළිඳු / දුප්පත් නොවේ (0)
හිමිකාරිත්වය නැති ....................... →දිළිඳු / දුප්පත් (1)

vi. අවම වශයෙන් ධීවර බෝට්ටු, ඒකාබද්ධ අස්වැන්න නෙලීමේ යන්ත්‍ර, කොළ මඩින යන්ත්‍ර වැනි එකක් හෝ සතුව තිබීම.

හිමිකාරිත්වය ඇති ...................... →දිළිඳු / දුප්පත් නොවේ (0)
හිමිකාරිත්වය නැති ....................... →දිළිඳු / දුප්පත් (1)

vii. අවම වශයෙන් ජීවනෝපායට අදාළ එක් වත්කමක්වත් නොතිබීම.

(කිරි ගවයින් 05, එළුවන් 20, කුකුලන් 50, තාරාවන් 50, ඌරන් 10 වැනි ක්ෂුද්‍ර සත්ව පාලනය)

හිමිකාරිත්වය ඇති ...................... →දිළිඳු / දුප්පත් නොවේ (0)
හිමිකාරිත්වය නැති ....................... →දිළිඳු / දුප්පත් (1)

5. **නිවාසවල තත්වය**

i. නිවාස ඒකකවල ස්වභාවය

නිවාස ඒකක වල ස්වභාවය *= ....................... →දිළිඳු / දුප්පත් නොවේ (0)
නිවාස ඒකකවල ස්වභාවය **= ....................... →දිළිඳු / දුප්පත් (1)

* නිවාස ඒකකවල ස්වභාවය තනි නිවාස (තනි මහල්), තනි නිවාස (දෙමහල්), තනි නිවාස (මහල් 2 ට වැඩි) බද්ධ නිවාස/ ඇනෙක්සි, සුඛෝපභෝගී නිවාස, ද්විත්ව නිවාස වේ නම් ඔවුන් දිළිඳු / දුප්පත් නොවන ලෙස සැලසේ.
** නිවාස ඒකකවල තත්වය ලයින් නිවාස / ලයින් කාමර / මුඩුක්කු / මඩු හෝ වෙනත් ආකාරය වේනම් ඔවුන් දිළිඳු / දුප්පත් ලෙස සැලකේ.

(ii) නිවාස ඉදිකිරීම යොදාගෙන ඇති ප්‍රධාන අමුද්‍රව්‍ය :

*අ.* බිත්ති සඳහා යොදා ගෙන ඇති අමු ද්‍රව්‍ය.
බිත්ති - ස්ථිර අමුද්‍රව* ....... →දිළිඳු / දුප්පත් නොවේ (0)
බිත්ති - අර්ධ ස්ථිර අමුද්‍රව්‍යයක්** ....... →දිළිඳු / දුප්පත් (1)

* ගඩොල්, කබොක්, සිමෙන්ති ගල්, ගල්, මැටි ගල් බිත්ති සඳහා යොදා ගනු ලබන ස්ථිර අමුද්‍රව්‍ය වේ.
** මැටි, ලෑලි, ටකරන්, පොල් අතු, තල් අතු හා වෙනත් සමාන ද්‍රව්‍ය අර්ධ ස්ථිර අමුද්‍රව්‍ය ලෙස හඳුනාගැනේ.

*ආ.* ගෙබිම සඳහා යොදා ගන්නා ප්‍රධාන අමුද්‍රව්‍ය :
ගෙබිම- ස්ථිර අමුද්‍රව්‍ය* ....... →දිළිඳු / දුප්පත් නොවේ (0)
ගෙබිම - අර්ධ - ස්ථිර අමුද්‍රව** ....... →දිළිඳු / දුප්පත් (1)

* සිමෙන්ති, ටෙරාසෝ / පිඟන් ගඩොල්, කොන්ක්‍රීට් ගෙබිම සඳහා යෙදාගනු ලබන ස්ථිර අමුද්‍රව්‍ය වේ.
** මැටි, ලෑලි, වැලි හා වෙනත් ඒ හා සමාන ද්‍රව්‍ය අර්ධ ස්ථිර අමුද්‍රව්‍ය ලෙස සලකනු ලැබේ.

*ඇ.* වහලය සඳහා යොදා ගනු ලබන ප්‍රධාන අමුද්‍රව්‍ය :
වහලය - ස්ථිර අමුද්‍රව්‍ය* ....... →දිළිඳු / දුප්පත් නොවේ (0)
වහලය - අර්ධ ස්ථිර අමුද්‍රව්‍ය** ....... →දිළිඳු / දුප්පත් (1)

* උලු, ඇස්බැස්ටෝස්, කොන්ක්‍රීට්, ඇළුමිණියම් මිශ්‍ර තහඩු වහලය සඳහා යොදා ගනු ලබන ස්ථිර අමුද්‍රව්‍ය වේ.
** ටකරන්, පොල් අතු, තල් අතු, පිදුරු හෝ වෙනත් ඒ හා සමාන ද්‍රව්‍ය, අර්ධ - ස්ථිර අමුද්‍රව්‍ය වේ.

බිත්ති, ගෙබිම හා වහලය ස්ථිර අමුද්‍රව්‍ය වලින් සාදා ඇත්නම් විට දිළිඳු / දුප්පත් නොවන ලෙස සලකනු ලබන අතර, ඉහත කුමක් හෝ අර්ධ - ස්ථිර අමුද්‍රව්‍ය යොදා ගන්නේ නම් දිළිඳු / දුප්පත් ලෙස සලකනු ලැබේ.

(iii) ගෙබිම ප්‍රමාණය :

ගෙබිම ප්‍රමාණය වර්ග අඩි 500 හෝ ඊට වඩා වැඩි * ....... →දිළිඳු / දුප්පත් නොවේ (0)
ගෙබිම ප්‍රමාණය වර්ග අඩි 500ට අඩු ** ....... →දිළිඳු / දුප්පත් (1)

* ගෙබිම ප්‍රමාණය වර්ග අඩි 500 හෝ ඊට වැඩි නම් දිළිඳු / දුප්පත් නොවන ලෙස සලකනු ලැබේ.
** ගෙබිම ප්‍රමාණය වර්ග අඩි 500ට අඩු නම් දිළිඳු / දුප්පත් ලෙස හඳුන්වනු ලැබේ.

iv. ප්‍රධාන පානීය ජල ප්‍රභවය :

ප්‍රධාන පානීය ජල ප්‍රභවය - ආරක්ෂිත* ....... →දිළිඳු / දුප්පත් නොවේ (0)
ප්‍රධාන පානීය ජල ප්‍රභවය - ආරක්ෂිත නොවන** ....... →දිළිඳු / දුප්පත් (1)

* පානීය ජලය වශයෙන් ලබාගන්නා ලද මූලාශ්‍රය ආරක්ෂිත නම්, එනම් එම ජල මූලාශ්‍රය ; ආරක්ෂිත ළිඳක්, නල ජලය (ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය / ප්‍රජා මූලික ජල සැපයුම/ පළාත් පාලන ආයතන/ පෞද්ගලික ජල ව්‍යාපෘති), නල ළිඳ, ප්‍රති ආසෘත ජලය (RO Filtered water), බෝතල් කළ ජලය වන විට එම ජලය ආරක්ෂිත පානීය ජලය ලෙස සලකනු ලැබේ. මෙම පහසුකම් ඇති පවුල් මෙම මානයෙන් දුප්පත් නොවන ලෙස සලකනු ලැබේ.

** පානීය ජලය ප්‍රධාන වශයෙන් ලබා ගන්නා ජල මූලාශ්‍රය අනාරක්ෂිතය නම්, එනම් එම ජල මූලාශ්‍රය ; අනාරක්ෂිත ළිඳ, ප්‍රති ආසෘත නොවන ජලය සහිත ජලබවුසර්, වැව්/ගංගා/දොළ/උල්පත්, වැසි ජලය හෝ ඒ හා සමාන වෙනත් ආනාරක්ෂිත ප්‍රභවයකින් පානීය ජලය ලබා ගන්නේ නම්, එම පවුල මෙම මානයෙන් දුප්පත් ලෙස සලකනු ලැබේ.

(v) වැසිකිලි පහසුකම් :

වැසිකිලි පහසුකම්* ....... →දිළිඳු / දුප්පත් නොවේ (0)
වැසිකිලි පහසුකම්** ....... →දිළිඳු / දුප්පත් (1)

* වැසිකිලි පහසුකම් වැඩිදියුණු කර ඇති නම් එනම් ජල මුද්‍රිත වැසිකිළි පහසුකම් හා පවුලේ සමාජිකයින්ගේ තනි ප්‍රයෝජනයට පමණක් වෙන්කර ඇත්නම්, ඒම පවුල මෙම මානයෙන් දුප්පත් නොවන ලෙස සලකනු ලැබේ.

** වැසිකිලි පහසුකම් නොමැති නම්, එනම් ජල මුද්‍රිත නොවන වැසිකිලි භාවිතා කරයි නම් හෝ භාවිතා කරන වැසිකිළි හා වෙනත් පවුලක් හෝ වෙනත් නිවසක් සාමාජිකයින් සමග හවුලේ භාවිතා කරයි නම්, පොදු වැසිකිලියක් භාවිතා නොකරයි නම්, මෙම දර්ශකයෙන් එම පවුල දුප්පත් යැයි සැලකේ.

(vi) ප්‍රධාන ආලෝක ප්‍රභවය :

ආලෝක කරණය* ....... →දිළිඳු / දුප්පත් නොවේ (0)
ආලෝක කරණය** ....... →දිළිඳු / දුප්පත් (1)

* ප්‍රධාන ආලෝක ප්‍රභවය විදුලිය සූර්ය ශක්තිය, විදුලි ජනක යන්ත්‍ර/ බැටරි, ජීව වායුව වන්නේ නම්, දිළිඳු / දුප්පත් ලෙස සලකනු නොලැබේ.

** ප්‍රධාන ආලෝක ප්‍රභවය භූමිතෙල් හෝ වෙනත් සමාන ප්‍රභවයක් නම් දුප්පත් ලෙස සැලකේ.

**6. පවුලේ ජන විකාශය :**

(i) යැපීම් අනුපාතය

අවුරුදු 0-14 අතර සිටින සංඛ්‍යාව සහ අවුරුදු 65 හා ඊට වැඩි වයස ඇති අය
________________________________________
අවුරුදු 15-64 අතර සිටින පුද්ගලයින් සංඛ්‍යාව

මේ අනුව යැපුම් අනුපාතය, තීරණය කරනු ලබන ප්‍රතිශතය හෝ ඊට වඩා අඩු ..... →දිළිඳු / දුප්පත් නොවේ (0)
යැපීම් අනුපාතය, තීරණය කරනු ලබන ප්‍රතිශතය වඩා වැඩි ............ → දිළිඳු / දුප්පත් (1)

යැපීම් අනුපාතය තීරණය කරනු ලබන ප්‍රතිශතයට සමාන හෝ වැඩි නම් දිළිඳු / දුප්පත් ලෙස සලකනු ලැබේ. යැපීම් අනුපාතය තීරණය කරනු ලබන ප්‍රතිශතය වඩා අඩු නම් දිළිඳු / දුප්පත් ලෙස සලකනු නොලැබේ.

(ii) මව හෝ පියා පමණක් සිටින පවුල්

විවාහක තත්වය - දෙමාපිය දෙදෙනාම ජීවත්වන ............ →දිළිඳු / දුප්පත් නොවේ (0)
විවාහක තත්වය - දෙමාපියන්ගෙන් එක් අයෙකු ජීවත්වන ............ →දිළිඳු / දුප්පත් (1)

මව හෝ පියා පමණක් සිටින පවුල් දිළිඳු / දුප්පත් ලෙස සැලකේ.

❖ **සටහන : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව නිකුත් කර ඇති ආසන්න අතීත ගෘහස්ථ ඒකපුද්ගල ආදායම හා වියදම් සමීක්ෂණයේ දත්ත පදනම් කරගෙන ජනගහනයෙන් දිළිඳුම 40%යේ පවුල්වල සීමා ලකුණ තීරණය කරනු ලැබේ.**

## III කොටස

### දරිද්‍රතා ලකුණු ලබාදීම ගණනය කිරීමේ සූත්‍රය

දිළිඳු බව සඳහා ලකුණු දීම ගණනය කිරීමේ සූත්‍රය පුද්ගලයෙකුගේ දරිද්‍රතාවය ගණනය කිරීම පියවර 3 කින් සිදු කෙරේ.

1. දිළිඳු බව දර්ශකය ගණනය කිරීම.
2. දර්ශක සඳහා බර තැබීම ගණනය කිරීම
3. තනි පුද්ගලයෙකු සඳහා බර තබන ලද දරිද්‍රතා ලකුණු දීම ගණනය කිරීම.

**දරිද්‍රතා දර්ශකය ගණනය කිරීම**

i යන පුද්ගලයා j දර්ශකය සතු වන්නේ නම්, ඔහුගේ/ඇයගේ දරිද්‍රතා දර්ශකය පහත සමීකරණය

i දර්ශකයේ ඒක පුද්ගල අගය $_{xj}$ (i)

එවිට,

$\mu_j(\mathrm{i}) = 1$ මේ දර්ශකයේ ඇති පුද්ගලයා දිළිඳුවේ.

$\mu_j(\mathrm{i}) = 0$ මේ දර්ශකයේ ඇති පුද්ගලයා දිළිඳු නොවේ.

**බර තැබීම සඳහා යුතුය.**

සංඛ්‍යාතය පදනම් කරගත් ශ්‍රිතය යොදා ගෙන බර තැබීම් ගණනය කරනු ලැබේ. වසර තුනකට වරක් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලබන ගෘහස්ත ඒකක ආදායම හා වියදම් සමීක්ෂණය (HIES) යොදාගෙන දිස්ත්‍රික් වශයෙන් විවිධ දරිද්‍රතා මට්ටම්වල සාපේක්ෂ වැදගත්කම සැලකීමට භාජනය කරමින් දර්ශකවලට බරතැබීම් කරනු ලැබේ. මෙම එක් එක් දිස්ත්‍රික්කය සඳහා බරතැබීම් එක් කාල පරිච්ඡේදයකට සීමා කරනු ලබන අතර නව HIES දත්ත ලබාගත හැකිවිට සමාලෝචනය කෙරේ.

$$w_j = \frac{In\frac{1}{f_j}}{\sum_{j=1}^{k} In\frac{1}{f_j}} \times 100; j = 1,2, \ldots\ldots\ldots\ldots\ldots\ldots. k$$

*fj* මගින් i දිස්ත්‍රික්කයේ සම්පූර්ණයෙන්ම j දර්ශකයට ගණනය වන දරිද්‍රතා පුද්ගල සංඛ්‍යාව දැක්වෙන අතර, k යනු දර්ශක ගණන වේ. (i = දිස්ත්‍රික්ක 1.2 ..................... 25)

බරතැබීමේ අඩු අගයන් මගින් අදාළ දිස්ත්‍රික්කයේ දිළිඳු පුද්ගල සංඛ්‍යාව අඩු බව දැක්වේ. එනම් අඩු අගයක් මගින් දර්ශකයට අඩු වැදගත්කමක් ලැබේ. ඉහළ බරතැබීමේ අගයන් ගැනීමෙන් අදාළ දර්ශකයෙන් දිළිඳු පුද්ගල සංඛ්‍යාව වැඩි බව දක්වන අතර අඩු බර තැබීමේ එම දර්ශකයට වැඩි වැදගත්කමක් ලැබේ.

**ඒක පුද්ගලයෙකු සඳහා බර තබන ලද දරිද්‍රතා ලකුණු ගණනය කිරීම**

$$\mu_{wi} = \sum_{j=1}^{k} \omega_j \times \mu_{Ai}(j)$$

$\mu_j$ මගින් පුද්ගලයෙකු සඳහා බරතැබූ දරිද්‍රතා ලකුණු දීම දක්වනු ලැබේ. මැන බලන ලද දරිද්‍රතා අගය 0 - 1 අතර වන අතර 0 දෙසට වන්නට අඩු අගයක් ද 1 දෙසට වන්නට ඉහල දරිද්‍රතාවයක් ද පෙන්නුම් කෙරේ.

**කල්පිත දත්ත යොදාගත් උදාහරණය :**

| දර්ශකය | පවුල | | | | | | | | අවසාන මිණුම් |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | ගණන (F) | 1/f | In | මිණුම් 1 | |
| 1. අධ්‍යාපනය | | | | | | | | | |
| (i) පවුලේ සමාජිකයෙකු අවම වශයෙන් අ.පො.ස. (සා.පෙළ) දක්වා සම්පූර්ණ කර නොතිබීම. | 0 | 1 | 1 | 1 | 3 | 1/3 | -1.10 | 0.062548 | 6.25 |
| (ii) පාසල් යන වයසේ (5-16) පවුලේ එක් සාමාජිකයෙකුවත් පාසලට නොයෑම. | 0 | 0 | 1 | 1 | 2 | 1/2 | -0.69 | 0.39464 | 3.95 |
| 2. සෞඛ්‍ය | | | | | | | | | |
| (i) පවුලේ එක් සාමාජිකයෙකු හෝ දිගුකාලීන නිදන්ගත රෝගයකින් පෙළීම. | 0 | 1 | 1 | 0 | 2 | 1/2 | -0.69 | 0.39464 | 3.95 |
| (ii) පවුලේ ආබාධිත සාමාජිකයෙකු සිටීම. | 0 | 1 | 1 | 1 | 3 | 1/3 | -1.10 | 0.062548 | 6.25 |
| 3. ආර්ථික මට්ටම | | | | | | | | | |
| (i) මාසික ඒක පුද්ගල වියදම රු. 5,500 ට අඩුවීම | 0 | 1 | 1 | 0 | 2 | 1/2 | -0.69 | 0.39464 | 3.95 |
| (ii) මාසික ඒක පුද්ගල වියදම රු. 6,000 ට අඩුවීම | 0 | 1 | 1 | 1 | 3 | 1/3 | -0.10 | 0.062548 | 6.25 |
| (iii) මසකට ඒකක 60ට වඩා අඩු විදුලි පරිභෝජනය. | 0 | 0 | 1 | 1 | 2 | 1/2 | -0.69 | 0.039464 | 3.95 |
| 4. වත්කම් | | | | | | | | | |
| (i) වාසය කරන නිවාස හා ඉඩම පවුලේ සාමාජිකයෙකුට හිමි වී නොතිබීම. | 0 | 0 | 1 | 1 | 2 | 1/2 | -0.69 | 0.039464 | 3.95 |
| (ii) පවුලේ සාමාජිකයෙකු සඳහා වෙනත් නිවසක හෝ ගොඩනැගිල්ලක අයිතියක් නොතිබීම. | 0 | 1 | 1 | 0 | 2 | 1/2 | -0.69 | 0.039464 | 3.95 |
| (iii) පවුලට අවම වශයෙන් අක්කර 0.5ක වගා කල හැකි ගොඩ ඉඩමක් නොතිබීම. | 0 | 0 | 1 | 1 | 2 | 1/2 | -0.69 | 0.039464 | 3.95 |

| දර්ශකය | පවුල | | | | | | | | අවසාන මිණුම් |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | ගණන (F) | 1/f | In | මිණුම් 1 | |
| (iv) පවුලට අවම වශයෙන් අක්කර 1 කට වඩා වැඩි වගා කළ හැකි කුඹුරු ඉඩමක් නොතිබීම. | 1 | 1 | 0 | 0 | 2 | 1/2 | -0.69 | 0.039464 | 3.95 |
| (v) ගමනාගමනයට අදාළ එක් වත්කමක්වත් නොතිබීම. (මෝටර් සයිකල් cc 125, ත්‍රී රෝද රථයක්, වෑන් රථයක්, ජීප් රථයක්, බසයක්, ලොරි රථයක්, ටිපර් රථයක්, අත් ට්‍රැක්ටයක් (රෝද 2), ට්‍රැක්ටරයක් (රෝද 4) | 0 | 0 | 1 | 1 | 2 | 1/2 | -0.69 | 0.039464 | 3.95 |
| (vi) අවම වශයෙන් ආර්ථික ක්‍රියාකාරකමකට අදාළ එක් වත්කමක්වත් නොතිබීම. (ධීවර බෝට්ටු, ඒකාබද්ධ අස්වැන්න නෙලීමේ යන්ත්‍ර, කොළ මඬින යන්ත්‍ර) | 1 | 1 | 1 | 0 | 2 | 1/3 | -1.10 | 0.062548 | 6.25 |
| (vii) අවම වශයෙන් ජීවනෝපායට අදාළ එක් වත්කමක්වත් නොතිබීම. (කිරි ගවයින් 05, එළුවන් 20, කුකුළන් 50, තාරාවන් 50, ඌරන් 10) | 1 | 1 | 1 | 1 | 2 | 1/4 | -0.69 | 0.078927 | 7.89 |
| 5. නිවාස | | | | | | | | | |
| (i) ලැයිම් කාමර/පේලි නිවාස, මුඩුක්කු/ මඩුවල හෝ වෙනත් ස්ථානයක ජීවත්වීම. | 0 | 0 | 1 | 1 | 2 | 1/2 | -0.69 | 0.039464 | 3.95 |
| (ii) ජීවත්වීම ස්ථිර බිත්ති, ස්ථිර ගෙබිම හා ස්ථිර මහල සහිත නිවාසයක් නොමැතිවීම. | 0 | 1 | 0 | 1 | 2 | 1/2 | -0.69 | 0.039464 | 3.95 |
| (iii) සම්පූර්ණ බිම් ප්‍රදේශය වර්ග අඩි 500ට අඩුවීම. | 0 | 0 | 1 | 1 | 2 | 1/2 | -0.69 | 0.039464 | 3.95 |
| (iv) පිරිසිදු පානීය ජලය ලබාගැනීමේ හැකියාව නොමැතිවීම | 0 | 0 | 1 | 1 | 2 | 1/2 | -0.69 | 0.039464 | 3.95 |
| (v) ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් නොමැතිවීම. | 0 | 0 | 1 | 1 | 2 | 1/2 | -0.69 | 0.039464 | 3.95 |
| (vi) විදුලි බලය නොමැතිවීම. | 0 | 1 | 1 | 0 | 2 | 1/2 | -0.69 | 0.039464 | 3.95 |
| 6. පවුලේ ජන විකාශනය | | | | | | | | | |
| (i) යැපීම් අනුපාතය (64.2ට වඩා වැඩි). | 0 | 1 | 1 | 0 | 2 | 1/2 | -0.69 | 0.039464 | 3.95 |
| (ii) මව හෝ පියා පමණක් සිටින පවුලක් වීම. | 0 | 0 | 1 | 1 | 2 | 1/2 | -0.69 | 0.039464 | 3.95 |
| | 18.09 | 56.59<br>9 | 92.11 | 74.01 | 50 | | -<br>17.56 | | |

පවුල් 1 සඳහා බර තැබූ දරිද්‍රතා ලකුණු දීම.
(1*3.95) + (1*6.25) + (1*7.89) = 18.08

❖ ***විශේෂ සටහන*** **: ඉහත සඳහන් මානයන්, දර්ශක සහ දරිද්‍රතා සීමා ලකුණු යාවත්කාලීන කිරීම මහ භාණ්ඩාගාරයේ අනුදැනුම මත අදාළ දෙපාර්තමේන්තු / ආයතන විසින් විටින් විට සිදු කරනු ලබයි.**

දෙවන උපලේඛනය [2 (4) (ආ) නියෝගය]

මුදල්, ආර්ථික ස්ථායිකරණ
සහ ජාතික ප්‍රතිපත්ති
අමාත්‍යාංශය

සුහසාධක ප්‍රතිලාභ මණ්ඩලය

| කාර්යාලීය ප්‍රයෝජනය සඳහා | |
|---|---|
| අනුක්‍රමික අංකය | |

| සමෘද්ධි පවුල් ඒකක අංකය |
|---|
| |

# ඉල්ලුම්කරුගේ ප්‍රකාශනය

## සුහ සාධක ප්‍රතිලාභ මණ්ඩලය

| පළාත | අංකය |
|---|---|
| | |

| දිස්ත්‍රික්කය | අංකය |
|---|---|
| | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | අංකය |
|---|---|
| | |

| ග්‍රාම නිළධාරී කොට්ඨාසය | ග්‍රා. නි. කො. අංකය: |
|---|---|
| | |

| කලාපීය සමෘද්ධි මධ්‍යස්ථානය | මධ්‍ය: අංකය |
|---|---|
| | |

01. හඳුනාගැනීමේ මූලික තොරතුරු :

1.1 ඉල්ලුම් කරන්නාගේ සම්පූර්ණ නම (සිංහල අකුරින්)

1.2 ඉල්ලුම් කරන්නාගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

1.3 ඉල්ලුම් කරන්නාගේ ජාතික හැඳුනුම්පත් අංකය

1.4 පදිංචි ස්ථානයේ ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

1.5 ඉල්ලුම් කරන්නාගේ දුරකථන අංකය ස්ථාවර ජංගම

1.6 විද්‍යුත් තැපෑල

02. ප්‍රජා විද්‍යාත්මක තොරතුරු - පළමු කොටස

| 1 | 2 නම | 3 ඉල්ලුම්කරුට ඇති නෑ සබඳකම | | | | | | | | 4 | 5 | | | 6 | 7 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සාමාජික අංකය | ඉල්ලුම්කරුගේ නම මුලින්ම සෙසු පවුලේ සාමාජිකයින්ගේ නම් නෑදෑ සබඳකමේ අනුපිළිවෙල අනුව සඳහන් කරන්න | 01. ඉල්ලුම්කරු / ප්‍රතිලාභියා | 02. ස්වාමිපුරුෂයා / භාර්යාව | 03. පුතා / දුව | 04. බෑනා / ලේලි | 05. මුණුපුරා / මිනිපිරි | 06. පියා හෝ මව | 07. වෙනත් නෑදෑයන් | 09. වෙනත් | ස්ත්‍රී/පුරුෂ භාවය | උපන් දිනය: අවුරුද්ද | මාසය | දිනය | පසුගිය උපන් දිනට සම්පූර්ණ කළ වයස (අවුරුදු වලින්) | ජාතික හැඳුනුම්පත් අංකය |
| 01 | | | | | | | | | | | | | | | |
| 02 | | | | | | | | | | | | | | | |
| 03 | | | | | | | | | | | | | | | |
| 04 | | | | | | | | | | | | | | | |
| 05 | | | | | | | | | | | | | | | |
| 06 | | | | | | | | | | | | | | | |
| 07 | | | | | | | | | | | | | | | |
| 08 | | | | | | | | | | | | | | | |
| 09 | | | | | | | | | | | | | | | |
| 10 | | | | | | | | | | | | | | | |
| 11 | | | | | | | | | | | | | | | |
| 12 | | | | | | | | | | | | | | | |

02.- A ප්‍රජා විද්‍යාත්මක තොරතුරු - දෙවන කොටස

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 10 ප්‍රධාන ආර්ථික කටයුත්ත | 99. වෙනත් | | | | | | | | | | | | |
| | 11. සේවා කටයුතු | | | | | | | | | | | | |
| | 10. එදිනෙදා කුලිවැඩ | | | | | | | | | | | | |
| | 09. කාර්මික කටයුතු | | | | | | | | | | | | |
| | 08. ප්‍රවාහන කටයුතු | | | | | | | | | | | | |
| | 07. හස්ත කර්මාන්ත / ඇඟලුම් කටයුතු | | | | | | | | | | | | |
| | 06. වෙළඳාම් කටයුතු | | | | | | | | | | | | |
| | 05. ඉදිකිරීම් හා වඩු වැඩ | | | | | | | | | | | | |
| | 04. පතල් හා කැණිම් කටයුතු | | | | | | | | | | | | |
| | 03. සත්ව පාලන කටයුතු | | | | | | | | | | | | |
| | 02. ධීවර කටයුතු | | | | | | | | | | | | |
| | 01. ගොවිතැන් කටයුතු | | | | | | | | | | | | |
| 9 ප්‍රධාන ආර්ථික කටයුත්තේ ස්වභාවය | 10. වැටුප් නොලබා පවුලේ වැඩ කටයුතු වලට දායකවන්නා | | | | | | | | | | | | |
| | 09. රැකියාවක් සොයමින් සිටින | | | | | | | | | | | | |
| | 08. වැඩකළ නොහැකි (වයස්ගත/ආබාධිත) | | | | | | | | | | | | |
| | 07. තමාගේ ආර්ථික කටයුත්තක නිරතවන්නා | | | | | | | | | | | | |
| | 06. ශිෂ්‍යයා | | | | | | | | | | | | |
| | 05. විශ්‍රාමික | | | | | | | | | | | | |
| | 04. සේවායෝජක | | | | | | | | | | | | |
| | 03. පෞද්ගලික අංශයේ සේවක | | | | | | | | | | | | |
| | 02. අර්ධ රජයේ සේවක | | | | | | | | | | | | |
| | 01. රජයේ සේවක | | | | | | | | | | | | |
| 8 විවාහක අවිවාහක තත්වය | 05. වෙන්ව ජීවත් වන | | | | | | | | | | | | |
| | 04. කිසිදා විවාහ නොවූ | | | | | | | | | | | | |
| | 03. වැන්දඹු | | | | | | | | | | | | |
| | 02. විවාහක | | | | | | | | | | | | |
| | 01. අවිවාහක | | | | | | | | | | | | |
| 1 | සාමාජික අංකය | | | | | | | | | | | | |

02.- B ප්‍රති විද්‍යාත්මක තොරතුරු - තුන්වන කොටස

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | සාමාජික අංකය | | | | | | | | | | | | |
| 11 ආබාධිත තත්වය | 01. පූර්ව අන්ධ | | | | | | | | | | | | |
| | 02. පූර්ව ශ්‍රවන හා කථනාබාධ | | | | | | | | | | | | |
| | 03. මන්ද මානසික | | | | | | | | | | | | |
| | 04. සුසුම්නාවට හානි වූ | | | | | | | | | | | | |
| | 05. දෙපා අත්පා අහිමි වූ | | | | | | | | | | | | |
| | 06. මස්තිශ්කාඝාතය | | | | | | | | | | | | |
| | 07. බහු ආබාධිත | | | | | | | | | | | | |
| | 08. ඔටිසම් | | | | | | | | | | | | |
| 12 දීර්ඝ කාලීන රෝග | 01. හෘද රෝග | | | | | | | | | | | | |
| | 02. දියවැඩියාව | | | | | | | | | | | | |
| | 03. පිළිකා | | | | | | | | | | | | |
| | 04. අධි රුධිර පීඩනය | | | | | | | | | | | | |
| | 05. වකුගඩු රෝග | | | | | | | | | | | | |
| | 06. මානසික රෝග | | | | | | | | | | | | |
| | 07. වෙනත් | | | | | | | | | | | | |
| 13 දැනට පාසලක හෝ වෙනත් අධ්‍යාපනආයතනයක ඉගෙනුම | 01. පෙර පාසල් | | | | | | | | | | | | |
| | 02. පාසල් | | | | | | | | | | | | |
| | 03. විශ්ව විද්‍යාල | | | | | | | | | | | | |
| | 04. කාර්මික/වෘත්තීය ආයතන | | | | | | | | | | | | |
| 14 අධ්‍යාපනික තත්වය | 01. පළමු ශ්‍රේණියේ ඉගෙනුම ලැබූ/ලබන | | | | | | | | | | | | |
| | 02. පළමු ශ්‍රේණිය සමත් | | | | | | | | | | | | |
| | 03. පස්වන ශ්‍රේණිය සමත් | | | | | | | | | | | | |
| | 04. අටවන ශ්‍රේණිය සමත් | | | | | | | | | | | | |
| | 05. දහවන ශ්‍රේණිය සමත් | | | | | | | | | | | | |
| | 06. අපොස සාමාන්‍ය පෙළ හෝ සමාන විභාගයක් සමත් | | | | | | | | | | | | |
| | 07. අපොස උසස් පෙළ හෝ සමාන විභාගයක් සමත් | | | | | | | | | | | | |
| | 08. උපාධිය සමත් | | | | | | | | | | | | |
| | 09. විශේෂ අධ්‍යාපනය ලැබූ/ලබන | | | | | | | | | | | | |
| | 10. කිසිදා පාසල් නොගිය | | | | | | | | | | | | |

## 03. පවුලේ සාමාන්‍ය මාසික ආදායම

| නම | | | | | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| සාමාජික අංකය | | | | | | | | | | |
| වැටුප්/වේතන මගින් | | (රු:) | | | | | | | | |
| විශ්‍රාම වැටුප් (ගොවි/ධීවර/රක්ෂණ ආදී ඇතුලුව) | | (රු:) | | | | | | | | |
| සමෘද්ධි | | (රු:) | | | | | | | | |
| දීමනා මගින් | ආබාධිත දීමනා | (රු:) | | | | | | | | |
| | රෝග සඳහා ආධාර (පිළිකා/ක්‍ෂය රෝග,තැලිසීමියා) | (රු:) | | | | | | | | |
| | මහජන ආධාර | (රු:) | | | | | | | | |
| වෙනත් රාජ්‍ය මූලාශ්‍ර ආධාර | පොහොර සහනාධාර | (රු:) | | | | | | | | |
| | ගැබිනි මව්වරුන් සඳහා පොෂණ ආධාර | (රු:) | | | | | | | | |
| | ස්වයං රැකියා ආධාර | (රු:) | | | | | | | | |
| | නිවාස ආධාර | (රු:) | | | | | | | | |
| | ජනාධිපති අරමුදල් ආධාර | (රු:) | | | | | | | | |
| | ආපදා ආධාර | (රු:) | | | | | | | | |
| ස්වයං රැකියා මගින් | කෘෂිකාර්මික/පශු/ධීවර කටයුතු | (රු:) | | | | | | | | |
| | කෘෂිකාර්මික නොවන | (රු:) | | | | | | | | |
| | විදේශ රටකින් | (රු:) | | | | | | | | |
| | මෙරටින් | (රු:) | | | | | | | | |
| වෙනත් ආදායම් | | (රු:) | | | | | | | | |
| එකතුව | | (රු:) | | | | | | | | |

### 04. පවුලේ සාමාන්‍ය මාසික වියදම

| අනු. අංකය | වියදම් කාණ්ඩය | වියදම (රුපියල්) |
|---|---|---|
| 01 | ආහාර පාන | |
| 02 | ඇඳුම් පැළඳුම් | |
| 03 | ඉන්ධන/ගෑස් | |
| 04 | විදුලිබල ගාස්තු | |
| 05 | නිවාස කුලිය/බද්ද | |
| 06 | නිවාස නඩත්තු | |
| 07 | සෞඛ්‍ය (ප්‍රතිකාර හා බෙහෙත්) | |
| 08 | අධ්‍යාපනය | |
| 09 | ප්‍රවාහන වියදම් | |
| 10 | මත්පැන්, බුලත් විට, සිගරට්, බීඩි | |
| 11 | ගෘහ උපකරණ | |
| 12 | ණය වාරික | |
| 13 | දුරකථන | |
| 14 | ජලය | |
| 15 | වෙනත් | |
| | මුලු වියදම | |

### 05. ඉඩම් ගොඩනැගිලි වත්කම් හා ආපදා තත්ත්වයන් පිළිබඳ තොරතුරු

5.1 ඔබ පදිංචි නිවස සහ ඉඩම ඔබට/ඔබගේ පවුලේ සාමාජිකයෙකුට/සාමාජිකයන්ට අයත් ද ?

01 ඔව්    02 නැත

5.2 ඔබට/ඔබගේ පවුලේ සාමාජිකයන්ට අයත් වෙනත් නිවාස/ගොඩනැගිලි ආදී වත්කම් තිබේ ද ?

01 ඇත    02 නැත

5.3 A ඔබට/ඔබගේ පවුලේ සාමාජිකයන්ට අයත් ගොඩ ඉඩම් ආදී වත්කම් තිබේ ද ?

01 ඔව්    02 නැත

5.3 B ඔව් නම් අක්කර 0.5 (1/2) ට අඩු 01   වැඩි හෝ සමාන 02

5.4 A ඔබට/ඔබගේ පවුලේ සාමාජිකයන්ට අයත් මඩ ඉඩම් ආදී වත්කම් තිබේ ද ?

01 ඔව්    02 නැත

5.4 B ඔව් නම් අක්කර 1 ට අඩු 01   වැඩි හො සමාන 02

5.5 A පසුගිය අවුරුදු 03 තුළ දී මෙම නිවාස ඒකකයට හෝ සාමාජිකයන්ට මෙම නිවස පිහිටි ස්ථානයේදී යම්කිසි ස්වභාවික අපදාවකට/ව්‍යසනයකට මුහුණ පෑමට සිදුවුණි ද ?

01 ඔව්    02 නැත

5.5 B ඔව් නම් ගංවතුර 01   නියගය 02   වන සතුන් ගෙන් වූ හානි 03   සුළි සුළං 04

05 වෙනත් (විස්තර කරන්න) ..............................

5.5 C මුහුණ දුන් ස්වාභාවික ආපදාවේ ස්වභාවය

☐ ජීවිත හානි   07 ජීවත් වන නිවසට හානි සිදුවීම   08 දේපල හෝ වත්කම් හානි වීම

**06. 1 ඔබගේ පවුලේ සාමාජිකයන් සතු වෙනත් වත්කම්**

**6.1 වාහන**

| අනු. අංකය | වාහන වර්ගය | ගණන |
|---|---|---|
| 01 | මෝටර් බයිසිකල් (එන්ජින් ධාරිතාව CC125 හෝ ඊට වැඩි) | |
| 02 | ස්කූටර් (එන්ජින් ධාරිතාව CC125 හෝ ඊට වැඩි) | |
| 03 | ත්‍රිරෝද රථ | |
| 04 | මෝටර් රථ | |
| 05 | වෑන්/ජීප් | |
| 06 | බස් | |
| 07 | ලොරි/ටිපර් | |
| 08 | අත් ට්‍රැක්ටර් (රෝද 2) | |
| 09 | ට්‍රැක්ටර් (රෝද 4) | |

**6.2 යන්ත්‍ර හා උපකරණ - ආර්ථික කටයුතු සඳහා**

| අනු. අංකය | යන්ත්‍ර හා උපකරණ | ගණන |
|---|---|---|
| 01 | යාන්ත්‍රික ධීවර යාත්‍රා | |
| 02 | යාන්ත්‍රික නොවන ධීවර යාත්‍රා | |
| 03 | සංයුක්ත අස්වැන්න නෙලීමේ යන්ත්‍ර | |
| 04 | ගොයම් කපන/පාගින යන්ත්‍ර | |
| 05 | වෙනත් ධීවර/කෘෂි උපකරණ | |
| 06 | වෙනත් ස්වයං රැකියා උපකරණ | |

**6.3 සත්ව පාලනය/ජලජීවී වගාව**

| අනු. අංකය | සතුන් වර්ගය | ගණන |
|---|---|---|
| 01 | ගවයන් | |
| 02 | එළුවන් | |
| 03 | ඌරන් | |
| 04 | කුකුළන් | |
| 05 | තාරාවන් | |
| 06 | ජලජීවී සතුන් වගා ඒකක | |

**07 නිවාස තත්ත්වය**

**7.1 නිවාස ඒකකයේ ස්වභාවය**

- 01 තනි නිවාස - තනි මහල
- 02 තනි නිවාස - මහල් 2කට වඩා ඇති
- 03 තනි නිවාස - මහල් 2කට වඩා ඇති
- 04 අනුයුක්ත නිවස/උප ගෘහය
- 05 තට්ටු නිවාසය
- 06 සුපිරි තට්ටු නිවාසය
- 07 යුගල නිවාස
- 08 පේළි නිවාස/ලයින් කාමර
- 09 පැල්පත් නිවාස/මුඩුක්කු නිවාස
- 99 වෙනත් (විස්තර කරන්න)

**7.2 ගෙබිම වර්ගඵලය**

- 01 වර්ග අඩි 500 ට වඩා අඩු
- 02 වැඩි හෝ සමාන

**7.3 A බිත්ති**

- 01 ගඩොල්
- 02 කබොක්
- 03 සිමෙන්ති ගල්/කළුගල්
- 04 මැටි ගල්
- 05 මැටි
- 06 ලෑලි/ටකරන් ආදිය
- 07 පොල් අතු/තල් අතු ආදිය
- 09 වෙනත් (විස්තර කරන්න)

**7.3 B ගෙබිම**

- 01 සිමෙන්ති
- 02 ටෙරාසෝ/පිඟන් ගඩොල්
- 03 කොන්ක්‍රීට්
- 04 මැටි
- 05 ලී
- 06 වැලි
- 09 වෙනත් (විස්තර කරන්න)

**7.3 C වහළ**

- 01 උළු
- 02 ඇස්බැස්ටෝස්
- 03 කොන්ක්‍රීට්
- 04 ඇළුමිනියම් මිශ්‍ර තහඩු
- 05 ටකරන්
- 06 පොල් අතු/තල් අතු/පිදුරු ආදිය
- 09 වෙනත් (විස්තර කරන්න)

**7.5 බීමට ජලය ලබා ගන්නා වූ ප්‍රධාන මාර්ගය**

**ළිඳ**

- 01 ගෙවත්තේ ආරක්ෂිත ළිඳ (නල සහිත)
- 02 ගෙවත්තේ ආරක්ෂිත ළිඳ (නල රහිත)
- 03 ගෙවත්තේන් පිටත ආරක්ෂිත ළිඳ
- 04 ආනාරක්ෂිත ළිඳ

**ප්‍රධාන නල ජලය**

- 05 නිවස ඇතුලත නල ජලය
- 06 නිවාසයෙන් පිටත ගෙවත්ත තුළ ජල නල
- 07 ගෙවත්තෙන් පිටත ජල නල

**අනෙකුත්**

- 08 ග්‍රාමීය ජල ව්‍යාපෘති
- 09 නල ළිඳ
- 10 වැව්/ගංගා/ඇළ/දොළ/බුබුල
- 11 වැසි ජලය
- 12 බෝතල් කළ ජලය
- 99 වෙනත් (විස්තර කරන්න)

**7.4 A ආලෝකය ලබාගන්නා ප්‍රධාන මාර්ගය**

- 01 භූමිතෙල්
- 02 විදුලිය
- 03 සූර්ය බල ශක්තිය
- 04 ජෙනරේටරය/බැටරි මගින්
- 05 ජීව වායුව
- 09 වෙනත් (විස්තර කරන්න)

| 7.4.B සාමාන්‍ය මාසික විදුලි පරිභෝජන ඒකක ගණන (කිලෝ වොට් පැය) | |
|---|---|

**7.6 A වැසිකිළි පහසුකම්**

**ඒකකය තුළ**

- 01 පවුලේ තනි ප්‍රයෝජනයට
- 02 වෙනත් පවුලක් සමග හවුලේ

**ඒකකයෙන් පිටත**

- 03 පවුලේ තනි ප්‍රයෝජනයට
- 04 වෙනත් පවුලක් සමග හවුලේ

**අනෙකුත්**

- 05 වෙනත් ගෘහ කාණ්ඩයක් සමග හවුලේ
- 06 පොදු/ප්‍රසිද්ධ වැසිකිළිය
- 07 වැසිකිළි භාවිතා නොකරයි

**7.6 B වැසිකිළියේ ස්වභාවය**

- 01 ජල මුද්‍රිත වළකට/ටැංකියකට සම්බන්ධ
- 02 ජල මුද්‍රිත මළ ප්‍රවාහන පද්ධතියට සම්බන්ධ
- 03 ජල මුද්‍රිත නොවන
- 04 කෙලින්ම වල
- 09 වෙනත් (විස්තර කරන්න)

**8. බැංකු ගිණුම් විස්තර**

| ගිණුමේ සඳහන් නම | බැංකු ගිණුමේ අංකය | ගනුදෙනු කරන බැංකුව | ශාඛාව |
|---|---|---|---|
| | | | |

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. එසේම ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බවට තහවුරු වුවහොත් මා හට සුහසාධන හිමිකම නොලැබීමට හේතුවන බව දනිමි.

........................................................................ දිනය:...................................

ඉල්ලුම්කරුගේ අත්සන

**මෙම ඉල්ලුම්කරු / පවුලේ සාමාජිකයින් විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරන අතර,ඉදිරි කටයුතු සඳහා ඉදිරිපත් කරමි.**

| | | |
|---|---|---|
| නම : | නම : | නම : |
| අත්සන : | අත්සන : | අත්සන : |
| නිල මුද්‍රාව : | නිල මුද්‍රාව : | නිල මුද්‍රාව : |
| දිනය : | දිනය : | දිනය : |

**අනුමත කරමි.**

ප්‍රාදේශීය ලේකම්

අත්සන :...................................

දිනය :...................................

(නිල මුද්‍රාව තබන්න)

| |
|---|
| ලිපිනය: |

| |
|---|
| හදිසි දුරකථන අංකය (හොට් ලයින්): |
| ෆැක්ස් අංකය: |

| |
|---|
| විද්‍යුත් තැපෑල: |
| වෙබ් ලිපිනය: |

තුන්වන උපලේඛනය

[7 (1) නියෝගය]

මුදල් ආර්ථික ස්ථායීකරණ
සහ ජාතික ප්‍රතිපත්ති
අමාත්‍යාංශය

සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය

# හිමිකම්පෑම/විරෝධතා ඉදිරිපත් කිරීමේ අයදුම්පත

(සුබ සාධක ප්‍රතිලාභ පනතේ 11 වන වගන්තිය ප්‍රකාරව)

1.0 ඉදිරිපත් කරන පැමිණිල්ලේ ස්වභාවය
(අදාල පිළිතුර ඉදිරියේ ✓ ලකුණ යොදන්න.)

| | |
|---|---|
| ප්‍රතිලාභ සඳහා හිමිකම්පෑමක් | |
| විරෝධතා ඉදිරිපත් කිරීමක් | |

1.1 අයදුම්පත් අනුක්‍රමික අංකය
(දැනට ලියාපදිංචි වී ඇත්නම්)

1.2 සම්පූර්ණ නම
(හිමිකම්පාන්නාගේ/විරෝධතා ඉදිරිපත්කරන්නාගේ)

1.3 ජාතික හැඳුනුම්පත් අංකය
(හිමිකම්පාන්නාගේ/විරෝධතා ඉදිරිපත්කරන්නාගේ)

1.4 උපන් දිනය

1.5 ලිපිනය
(හිමිකම්පාන්නාගේ/විරෝධතා ඉදිරිපත්කරන්නාගේ)

1.6 දුරකථන අංකය
ගෘහස්ථ
ජංගම

1.7 පළාත

| | | |
|---|---|---|
| 1.8 | දිස්ත්‍රික්කය | |
| 1.9 | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය | |
| 1.10 | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | |
| 2.0 | අදාළ සුභ සාධක වැඩසටහන | |

2.1 විරෝධතාවයේ ස්වභාවය
(අදාළ පිළිතුර ඉදිරියේ ✓ ලකුණ යොදන්න)

| | |
|---|---|
| නුසුදුසු අයට ප්‍රතිලාභ ලැබීම | |
| පවුල් ඒකකය පිළිබඳ වැරදි තොරතුරු ලබාදීම | |

2.2 සම්පූර්ණ නම
(විරෝධතාවයට ලක්වන්නාගේ)

2.3 පදිංචි ලිපිනය
(විරෝධතාවයට ලක්වන්නාගේ)

2.4 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
(විරෝධතාවයට ලක්වන්නාගේ)

2.5 ග්‍රාම නිලධාරී කොට්ඨාසය
(විරෝධතාවයට ලක්වන්නාගේ)

3.0 හිමිකම්පෑම/විරෝධතාවය පිළිබඳ කෙටියෙන් සඳහන් කරන්න

(වචන 200 ට අඩුවෙන්)

04. වැඩි විස්තර/නැවත දැනුම්දීම කළයුතු ආකාරය
(අදාළ පිළිතුර ඉදිරියේ ✓ ලකුණ යොදන්න.)

| | | | | | |
|---|---|---|---|---|---|
| දුරකථනයෙන් | | කෙටි පණිවිඩ | | තැපෑලෙන් | |

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

............................................................ දිනය :................................................

අත්සන
(හිමිකම්පාන්නා/විරෝධතා ඉදිරිපත්කරන්නා)

EOG 10-0178